EDCS
අධ්‍යාපන සමුපකාර සමිතිය
கல்வி கூட்டுறவுச் சங்கம்
Education Co-operative Society

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

- සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය සඳහා 2027 වර්ෂයට පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැයසීම වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා 2026-12-09 දක්වා අයදුම්පත් කිකුත් කරනු ලැබේ.
- ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය අයදුම්පත් 2026-11-19 සිට 2026-12-09 දක්වා ඉරිදා, සඳුදා දිනයන් හැර සතියේ අනෙකුත් කාර්යාලයීය දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.30 දක්වා පහත ලිපිනයේ පිහිටි සමිති ප්‍රධාන කාර්යාලයේ 03 වන මහලෙන් ලබා ගත හැකිය.

  www.edcs.lk වෙබ් අඩවියට පිවිසීමෙන්ද අයදුම්පත් බාගත කරගත හැකි අතර, එසේ ලබාගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර, මහජන බැංකුවේ අංක 014100140112845 ගිණුමට රු. 500/- ගෙවා ලබාගත් රිසිට්පතද සමඟ අයදුම්පත තැපැල් මඟින් එවීම හෝ අතින් ගෙනැවිත් බාරදීමද කළ හැකිය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමිතියේ "ප්‍රධාන සභාපති" යනුවෙන් සටහන් කර පහත සඳහන් ලිපිනයට 2026 - 12 - 09 දින හෝ ඊට ප්‍රථමයෙන් ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් එවීම හෝ අතින් ගෙනැවිත් 02 මහලේ සැපයුම් අංශය වෙත භාරදීම කළයුතු අතර, ලිපි කවරයේ වම් පස ඉහළ **"2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කර තිබිය යුතු වේ.

සැපයුම් අයිතම	
01.	කාර්යාලයීය ලිපිද්‍රව්‍ය
02.	මුද්‍රණ කඩදාසි
03.	මුද්‍රණ යන්ත්‍ර ටෝනර් හා කාට්රිජ් වර්ග
04.	ලෙජර් බයින්ඩර්
05.	පොලිමර් මුද්දු, සහ ප්ලාස්ටික් නාම පුවරු
06.	කාර්යාලයීය යන්ත්‍ර (ෆොටෝකොපි/ පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර/ ඇඟිලි සලකුණු යන්ත්‍ර ආදී සියළුම)
07.	කාර්යාලයීය උපකරණ (වානේ අල්මාරි/ මේස හා පුටු/ රාක්ක වර්ග ඇතුළු උපකරණ)
08.	පවිත්‍රතාකාරක ද්‍රව්‍ය හා දියර වර්ග
සේවාවන්	
01	මුද්‍රණ කටයුතු
02	වාහන අමතර කොටස්
03	ටයර් ටියුබ් විල් එලයිමන්ට් සේවා සහ බැටරි සේවා කරන්නන්
04	වාහන සේදීම හා සේවා කටයුතු
05	සියළුම වර්ගයේ කාර්යාලයීය උපකරණ අලුත්වැඩියාව (ඡායා පිටපත් යන්ත්‍ර/ පරිගණක හා පරිගණක උපාංග ඇතුළු)
06	ගිනි නිවීමේ උපකරණ සවි කරන්නන්
07	වායු සමීකරණ යන්ත්‍ර සවි කරන්නන් හා සේවා කිරීම
08	පෙදරේරු. වඩු කාර්මික, වැල්ඩින් ශිල්පීන්, විදුලි කාර්මික හා ඇලුමිනියම් පාර්ටිෂන් කිරීම් කටයුතු
09	ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු
10	කාර්යාලයීය යන්ත්‍ර කුලියට සපයන්නන් (පරිගණක, පරිගණක මුද්‍රණ ඡායා පිටපත් හා වෙනත්)
11	වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට සපයන්නන්
12	සීඝ්‍රදූත සේවාව මඟින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම

සැපයුම්කරුවන් සඳහා වන පොදු කොන්දේසි මාලාව
www.edcs.lk වෙබ් අඩවියට පිවිස පරීක්ෂා කළ හැකිය.

- සැපයුම්කරුවන් වශයෙන් 2026 වර්ෂයට සමිතියේ ලියාපදිංචි වී ඇති ආයතන සහ පුද්ගලයින්ද 2027 වර්ෂය සඳහා නැවත ලියාපදිංචි විය යුතුය.
- මිල ගණන් කැඳවන අවස්ථාවන්හිදී නියමිත ප්‍රමිතීන්ට සහ ආදර්ශයන්ට අනුව සැපයුම් හා සේවාවන් ඉටු නොකරන හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හරින සැපයුම්කරුවන්ගේ නම් අසාධු ලේඛනගත කිරීමට කටයුතු කරනු ඇත.
- විශේෂ අවස්ථාවන්හි සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතියේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලබාගැනීම, ඇණවුම් කිරීම හෝ සැපයුම් හා සේවාව ලබා ගැනීමේ අයිතිය සමිතියේ කළමනාකාරීත්වය සතු වන බවද කාරුණිකව දන්වමි.

ප්‍රධාන සභාපති
සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය
අංක 294, ගාලුපාර, කොළඹ 03.